5029

චක්‍රලේඛ අංකය :- 04/2007

16 AUG 2007

මගේ අංකය :- එම්.19/විවිධ/04
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 280, කෙළින් වීදිය,
කොළඹ 11.
2007-08-08

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,
කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ රාජකාරි කටයුතු කෙරෙහි අගතිදායක ලෙස බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ වෘත්තියක නිරත වූ තැනැත්තන් එකී තනතුරුවලට පත් නොකිරීමට සකස් කළ නීති රීති

ඉහත සඳහන් කාරණය පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පහත සඳහන් (සංශෝධන) පනත්වල පිටපත් මේ සමඟ එවමි.

1. 2006 අංක 37 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත.
2. 2006 අංක 38 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත.
3. 2006 අංක 39 දරණ උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත.
4. 2006 අංක 40 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත.

02. මෙම සංශෝධන පනත් ක්‍රියාත්මක වන 2006-11-06 වෙනි දින සිට පහත සඳහන් තැනැත්තන් විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් වරයෙකු වශයෙන් හෝ වැඩබලන රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන් හෝ සහ රෙජිස්ට්‍රාර්වරයෙකුගේ ස්ථාවර ආදේශකවරයෙකු වශයෙන් හෝ පත්කිරීමට හෝ තෝරා ගැනීමට හෝ පත්කිරීමට නිර්දේශ කිරීමට හෝ කටයුතු නොකළ යුතු බව කරුණාවෙන් පෙන්වා දෙමි.

1. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු,
2. පළාත් සභා මන්ත්‍රීවරයෙකු,
3. පළාත් පාලන ආයතනයක සභිකයෙකු,
4. ශ්‍රී ලංකා ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරණ තැනැත්තෙකු,
5. රෙජිස්ට්‍රාර්වරයෙකුගේ රාජකාරි කටයුතු කෙරෙහි අගතිදායක ලෙස බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ වෘත්තියක නියුක්ත වූ තැනැත්තෙකු,